www.AlevelApi.com



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) වෛශ්‍ය වර්ණයට අයත් ස්වධර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)

(ii) ශ්‍රමණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ **තුනක්** ගෙනහැර දක්වන්න. (ලකුණු 03යි.)

(iii) කාන්තා නිදහස වෙනුවෙන් බුදුසමයෙන් ගනු ලැබූ පියවර තහවුරු කිරීමට සාධක **හතරක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 04යි.)

(iv) බුද්ධකාලීන භාරතීය සමාජය වාණිජ්‍යකරණය වෙමින් පැවති බවට සාධක **පහක්** කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05යි.)

(v) අජිත කේසකම්බලගේ ආගමික ඉගැන්වීම් මගින් සමාජ සදාචාරයට සිදුවන අහිතකර බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

**2.** (i) බුදුරජාණන් වහන්සේ 'අරහං' නාමයෙන් හැඳින්වීමට හේතු වූ සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි.)

(ii) බුදුරජාණන් වහන්සේගේ ත්‍රිවිද්‍යා ඥානය නම්කොට එහි අර්ථය ලියන්න. (ලකුණු 03යි.)

(iii) බුදුරජාණන් වහන්සේ විශිෂ්ට ශාස්තෘත්වයක් ප්‍රකට කළ බවට සාධක **හතරක්** ගෙනහැර දක්වන්න. (ලකුණු 04යි.)

(iv) ආනන්ද හිමියන් සතුව පැවති චරිත ලක්ෂණ තුළින් ලැබිය හැකි ආදර්ශ **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)

(v) වීතරාගී උතුමන් ස්වභාව සෞන්දර්යය අත්විඳි ආකාරය මූලාශ්‍රය සාධක **හතරක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06යි.)

**3.** (i) ''න භජේ පාපකෙ මිත්තේ '' යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02යි.)

(ii) එම ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03යි.)

(iii) දෙමාපිය-දූ දරු යුතුකම් හා වගකීම් දහය සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න. (ලකුණු 04යි.)

(iv) පුද්ගලයාගේ පරිහානියට හේතුවන පරාභව සූත්‍රාගත කරුණු **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)

(v) පුද්ගලයාගේ මෙලොව දියුණුවට හේතුවන මංගල සූත්‍රාගත කරුණු **හයක්** පිළිබඳ කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 06යි.)

[ දෙවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## II කොටස

**4.** (i) චතුර් වර්ණයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ විග්‍රහය නිර්මාණවාදී සංකල්පවලින් බැහැර වී ඇති අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ii) රාජ්‍ය පාලන තන්ත්‍රයේ යහපැවැත්ම විෂයයෙහි ප්‍රජා වගකීම් කවරේදැයි බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

**5.** (i) හොඳ-නරක ක්‍රියා තමා විසින්ම තීරණය කරගත හැකි ආකාරය බෞද්ධ සදාචාර නිර්ණායක ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10යි.)

(ii) වර්තමාන සමාජ ප්‍රශ්න හමුවේ සරල දිවිපැවැත්මක ඇති ප්‍රායෝගික වැදගත්කම බෞද්ධ සාරධර්ම ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

**6.** (i) නූතන පාරිසරික ගැටලු අවම කරගැනීමෙහිලා පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කරගත හැකි ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 10යි.)

(ii) "ආර්ථික සමෘද්ධිය වනාහි තෘප්තිමත් ගෘහස්ථ ජීවිතයකට අත්‍යවශ්‍ය සාධකයකි." ධනෝපායනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් සනාථ කරන්න. (ලකුණු 10යි.)

**7.** (i) ප්‍රථම ධර්ම සංගායනාවේ පසුබිම කෙටියෙන් දක්වා බුදුසසුනේ චිරස්ථිතිය වෙනුවෙන් එහිදී ගනු ලැබූ තීරණ පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ii) ධර්මාශෝක රජතුමාගෙන් සිදුවූ ශාසනික මෙහෙය ප්‍රමාණවත් සාධක මගින් ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10යි.)

**8.** (i) පැරණි ලක්දිව රාෂ්ට්‍ර පාලනය විෂයයෙහි බුදුසමය බලපෑ අයුරු උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ii) බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ ආරම්භය කෙටියෙන් දක්වා එහිලා භාවිත ආසන හා මුද්‍රා නිදසුන් මගින් විස්තර කරන්න. (ලකුණු 10යි.)

* * *

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .